අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov

මගේ අංකය / எனது இல. / My Ref. ED/1/9/2/11/2 - 2021 ඔබේ අංකය / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2021.01.16

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම පාසල් ප්‍රධානීන් (ප්‍රාථමික පන්ති පැවැත්වෙන රජයේ පාසල් හා රජයේ ආධාර ලබන/නොලබන පෞද්ගලික පාසල්)

**<u>2021 වර්ෂයේ පළමුවන ශ්‍රේණියට ඇතුළත්වන සිසුන් සඳහා විධිමත් ලෙස පන්ති ආරම්භ කිරීම.</u>**

රජයේ පාසල්වල හා රජයේ ආධාර ලබන/නොලබන පෞද්ගලික පාසල්වල 2021 වර්ෂයේ දී පළමුවන ශ්‍රේණියේ සිසුන් සඳහා විධිමත් ලෙස පන්ති ආරම්භ කිරීම 2021.02.15 වන දින සිදුකිරීමට තීරණය කර ඇත.

ඒ අනුව 2021.02.15 දින විධිමත් ලෙස පළමුවන ශ්‍රේණිය සඳහා පන්ති ආරම්භ කිරීමේ දී, විදුහල්පතිවරුන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති අංක ED/01/21/07/03/ 2020 – iii හා 2021.01.04 දිනැති, **Covid 19 වසංගත තත්ත්වය යටතේ සෞඛ්‍යාරක්ෂිතව පාසල් විවෘත කිරීම** යන ලිපිය සමඟ ඉදිරිපත් කර ඇති උපදෙස් අනුගමනය කළ යුතු අතර, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති අංක ED/01/09/06/01/05 – 2020 (1) හා 2021.01.05 දිනැති **රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල් 2021 වර්ෂයේ නව පාසල් වාරය සඳහා ආරම්භ කිරීම** යන ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් ද අනුගමනය කළ යුතු ය.

තව ද අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 2020.05.11 දින නිකුත් කර ඇති අංක 15/2020 දරන **Covid - 19 පැතිරීම වැළැක්වීම සඳහා පාසල් සහ අධ්‍යාපන ආයතන සූදානම් කිරීම** යන චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහයේ සඳහන් උපදෙස් හා මඟපෙන්වීම ද සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ලබා දී ඇති උපදෙස් ද අනුගමනය කළ යුතු අතර, පෙර වර්ෂවල සිදුකරන ලද පළමුවන ශ්‍රේණියට සිසුන් පිළිගැනීමේ උත්සව, රැස්වීම් ආදිය පැවැත්වීමෙන් වැළකී සිටිය යුතු ය. 2021.02.15 දිනට පසුව දරුවන් හඳුනාගැනීමේ ක්‍රියාකාරකම් සෞඛ්‍ය නීතිරීතිවලට අනුකූලව කළ යුතු අතර, සියලු ම සිසුන් එකවර කැඳවීමේ ක්‍රියාකාරකම්වලින් වැළකිය යුතු බව ද අවධාරණය කරමි.

මෙ සම්බන්ධව ඔබ විසින් දක්වන සහයෝගය අතිශයින් අගය කරමි.

මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය